# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2044/20 - 2017 නොවැම්බර් මස 06 වැනි සඳුදා - 2017.11.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 (2) වගන්තිය යටතේ වූ දැන්වීම

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ (ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත) 3 (2) වගන්තිය යටතේ සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ විෂය භාර අමාත්‍ය, මලික් සමරවික්‍රම වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසමින්, මෙම නිවේදනය මගින්,

(1) හම්බන්තොට වරාය (වරාය) සංවර්ධන ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කිරීම සහ වාණිජමය වශයෙන් ලාභදායී ජාතික වත්කමක් බවට එම ව්‍යාපෘතිය පත් කිරීම (ව්‍යාපෘතිය) පිණිස ඉහත කී පනතේ කාර්යය සඳහා එකී ව්‍යාපෘතිය ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගනු ලැබේ. මෙම ව්‍යාපෘතිය මගින් සුවිශේෂී ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ රටට අත්වනු ඇත ;

- මෙම ව්‍යාපෘතිය ජාතික වැදගත්කමකින් යුතු අතර රටේ සුභ සිද්ධිය පිණිස වූවකි. ස්කන්ධ ප්‍රාග්ධනය, ජාත්‍යන්තර වෘත්තීය කළමනාකාරිත්ව ප්‍රමිති ඒ සඳහා යෙදවීම මෙන්ම, ව්‍යාපෘතිය මගින් ජාතික ආර්ථිකය මත පටවා ඇති අධිකතර බර හා සෘණාත්මක බලපෑම් මග හරවා ගනිමින් ජවසම්පන්න ව්‍යාපාරික ආකෘතියක් උපයෝගී කර ගැනීම තුළින් දැනට පාඩු ලබන තත්ත්වයේ පවතින මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ලාභදායී ව්‍යාපාරයක් බවට පත් කෙරෙනු ඇත ;

- රට තුළ ක්‍රියාත්මක එක් සුවිශාලතම සෘජු විදේශ ආයෝජන ව්‍යාපෘතියක් වන මෙම ව්‍යාපෘතිය තුළින් විදේශ විනිමය ඉතා විශාල ප්‍රමාණයන්ගෙන් රට තුළට ගලා එන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන කාලය ඇතුළත එක්සත් ජනපද ඩොලර් මිලියන හාරසියයේ සිට හයසියය (එ.ජ. ඩොලර් මිලියන 400-600) අතර ප්‍රමාණයක අතිරේක ආයෝජන රට තුළට ගෙන්වා ගැනීමේ හැකියාව ද පවතී;

- තරගකාරීව හා කාර්යක්ෂමව මෙහෙයුම් කටයුතු සිදු කෙරෙන වාණිජ වරායක දැඩි අවශ්‍යතාවක් පවතින අතර වරාය ආශ්‍රිත මෙන්ම ආනයන අභිමුඛ ආයෝජන ආකර්ශනය කර ගැනීම සඳහා එවැනි වරායක් මහත් උත්ප්‍රේරකයක් ද වනු ඇත. ප්‍රතිව්‍යුහගත කරනු ලබන මෙම වරාය, සෘජු විදේශ ආයෝජන වැඩි වැඩියෙන් රට තුළට ගලා ඒම මෙන්ම අපනයන ඉහළ යාම සඳහා ඉඩ ප්‍රස්ථා සලසා දෙමින් එකී අවශ්‍යතාව සපුරාලනු ඇත.

- මෙම ව්‍යාපෘතිය මගින් දකුණු පළාතට සුවිශාල ප්‍රතිලාභ අත් කර දෙමින් යටිතල පහසුකම් සංවර්ධනයටත්, භව්‍ය රැකියා උත්පාදනයටත්, ඒ තුළින් එම පළාතේ වෙසෙන ජනතාවට ආදායම් උපයා ගැනීමේ අවස්ථා වර්ධනය කිරීමටත් මංපෙත් විවර කරයි. මෙම ව්‍යාපෘතිය මගින් දකුණු පළාතට සුවිශාල ප්‍රතිලාභ අත්කර දෙනු ඇත.

- මෙම ව්‍යාපෘතිය තුළින් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර සමුද්‍රීය මධ්‍යස්ථානයක තත්ත්වයට උත්ශ්‍රේණිගත වනු ඇත.

1A - G 26560 — 12 (2017/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති සමාගම වන්නේ සීමාසහිත හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝර්ට් ගෲප් (පෞද්ගලික) සමාගම යි. (ව්‍යාපෘති සමාගම). ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා එහි වාණිජ මෙහෙයුම් ආරම්භ කෙරෙන දිනය ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(5) වගන්තිය ප්‍රකාර පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් ආරම්භ වන වර්ෂ හතක (07) කාලය (ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන කාලය) තුළ විය යුතු ය.

(3) එක්සත් ජනපද ඩොලර් මිලියන හත්සිය අනූ හතරක (එ.ජ. ඩොලර් මිලියන 794) ආයෝජනයක් යොදවමින් හම්බන්තොට වරායේ මෙහෙයුම් වත්කම් සියල්ලෙහි කළමනාකරණය භාර ගනිමින් නැව් භාණ්ඩ මෙහෙයුම් හා ඒ ආශ්‍රිත මෙහෙයුම් කටයුතු (ව්‍යාපෘති ක්‍රියාකාරකම්) තවදුරටත් සංවර්ධනය කිරීම හා වාණිජකරණය කිරීම ව්‍යාපෘති සමාගම විසින් භාර ගනු ලැබේ.

(4) සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ප්‍රකාර, ඉහත ව්‍යාපෘතියේ කාර්යය සඳහා මෙම දැන්වීමේ 1 වන උපලේඛනයේ සඳහන් නිදහස් කිරීම් මෙම ව්‍යාපෘති සමාගමට අදාළ වන බව නිශ්චිතව දක්වනු ලැබේ.

## උපලේඛනය 1

(1) **2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

(i) *ආයතන ආදායම් බදු*

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් මඟින් උපයා ගනු ලබන ලාභ, ඉපැයීම් හා ආදායම් මත පනවනු ලබන ආදායම් බදු සම්බන්ධයෙන් වන 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන වර්ෂ විසි පහක (25) කාලයක් (බදු නිදහස් කාල සීමාව) සඳහා ව්‍යාපෘති සමාගමට අදාළ නොවිය යුතු ය.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුව, චයිනා මර්චන්ට්ස් පෝර්ට් හෝල්ඩිංග්ස් කොම්පැනි ලිමිඩට්, සීමාසහිත හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝර්ට් ගෲප් (පෞද්ගලික) සමාගම සහ ව්‍යාපෘති සමාගම අතර එළැඹුණු 2017 ජූලි මස 29 දින දරන අනුග්‍රහ ගිවිසුම (අනුග්‍රහ ගිවිසුම) බලාත්මක වන දින සිට වර්ෂ හතක (07) කාලයකින් එකී බදු නිදහස් කාල පරිච්ඡේදය ආරම්භ විය යුතු ය.

කෙසේ වුවද, එකී බදු නිදහස් කාල පරිච්ඡේදය අවසන් වූ පසු, තත්කාලයේ බලාත්මක දේශීය ආදායම් පනතේ විධි විධාන ප්‍රකාර ව්‍යාපෘති සමාගමේ ලාභ, ඉපැයීම් හා ආදායම් වලට අදාළ ආදායම් බදු ගෙවනු ලැබිය යුතු ය.

එතකුදු වුවත්, හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ආයෝජක වශයෙන් ඇතුළත් වීමේ දී ව්‍යාපෘති සමාගමේ කොටස් ගනුදෙනුව හෝ වත්කම් පැවරුම සම්බන්ධයෙන් සමායතන ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

කෙසේ වුවද, එකී බදු නිදහස් කාල පරිච්ඡේදය ඇතුළත ව්‍යාපෘතියේ දළ මෙහෙයුම් ආදායමෙන් 0.05% අනුපාතිකයක් මත ආර්ථික සේවා ගාස්තුව අදාළ වනු ඇත.

(ii) *ලාභාංශ මත බදු*

බදු නිදහස් ලාභයෙන්, ඉපැයීම් වලින් කොටස්කරුවන්ට ගෙවනු ලබන ලාභාංශ අනුග්‍රහ ගිවිසුම බලාත්මක වන දිනයේ සිට වර්ෂ විසි පහක (25) බදු නිදහස් කාල පරිච්ඡේදය තුළ හා එය ඉකුත් වීමෙන් පසු එක් වර්ෂයක (01) කාලයක් තුළ ආදායම් බද්දෙන් නිදහස් කළ යුතු ය.

(iii) *රඳවුම් බදු*

පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් ආරම්භ වන ඉදිරි වර්ෂ හතක (07) කාලය තුළ පහත සඳහන් ගාස්තු මත රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් කළ යුතු ය :

(අ) කළමනාකරණ ගාස්තු හා රාජ්‍ය භාගය, එතකුදු වුවත් එවැනි ගාස්තුවල සමස්ත එකතුව දළ මෙහෙයුම් ආදායමෙන් සියයට තුනක් (3%) නොඉක්ම විය යුතු ය.

(ආ) අලෙවිකරණ ගාස්තු, එතකුදු වුවත් එවැනි ගාස්තුවල සමස්ත එකතුව දළ මෙහෙයුම් ආදායමෙන් සියයට එකයි දශම පහක් (1.5%) නොඉක්ම විය යුතු ය.

(ඇ) ප්‍රසාද දීමනා කළමනාකරණ ගාස්තු, එතකුදු වුවත් එවැනි ගාස්තුවල සමස්ත එකතුව දළ මෙහෙයුම් ලාභයෙන් සියයට තුනක් (3%) නොඉක්ම විය යුතු ය.

කෙසේ වුවද, පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් ආරම්භ වන ඉදිරි වර්ෂ විසි පහක (25) කාලය තුළ ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ලබා ගත් විදේශ ණය පොලිය මත සහ උපදේශකයන් සඳහා ගෙවනු ලබන තාක්ෂණික ගාස්තු හෝ සේවා ගාස්තු මත රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් කරනු ලැබිය යුතු ය.

(iv) *උපයන විට ගෙවීමේ බදු*

පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් ආරම්භ වන ඉදිරි වර්ෂ හතක (07) කාලය තුළ ව්‍යාපෘති සමාගමේ විදේශීය රැකියා නියුක්තිකයන් උපයන විට ගෙවීමේ බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු අතර සෑම අවස්ථාවක දී ම එම සේවා නියුක්තිකයන් සංඛ්‍යාව විසි හතක (27) උපරිමයකට යටත් විය යුතු ය.

(2) **2002 අංක 14 දරන එකතු කළ අගය මත (වැට්) බදු පනත**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන පරිදි ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ ආනයන හා දේශීය මිලදී ගැනීම් හෝ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවාවන් සඳහා පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් ආරම්භ වන ඉදිරි වර්ෂ හතක (07) කාලය තුළ එකතු කළ අගය මත බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය. දේශීය මිලදී ගැනීම් හා ආනයන වලට අදාළ බදු නිදහස් කිරීම ව්‍යාපෘතියේ කාර්යය සඳහා ව්‍යාපෘති සමාගමේ කොන්ත්‍රාත්කරුට හෝ උප- කොන්ත්‍රාත්කරුට ද අදාළ විය යුතු ය.

එතකුදු වුවත්, හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ආයෝජක වශයෙන් ඇතුළත් වීමේදී ව්‍යාපෘති සමාගමේ කොටස් ගණුදෙනුව හෝ වත්කම් පැවරුම සම්බන්ධයෙන් එකතු කළ අගය මත බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(3) **2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත (PAL)**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන පරිදි පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් ආරම්භ වන ඉදිරි වර්ෂ හතක (07) කාලය තුළ ආනයන කරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ සඳහා වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් කරනු ලැබිය යුතු ය. ව්‍යාපෘති සමාගම විසින් ව්‍යාපෘතිය සඳහා කරනු ලබන සෘජු ආනයන හෝ ව්‍යාපෘති කාර්යය සඳහා කොන්ත්‍රාත්කරුවකු හෝ උප - කොන්ත්‍රාත්කරුවකු විසින් කරනු ලබන ආනයන සඳහා මෙම බදු නිදහස් කිරීම මෙහි පහත අයිතම අංක (07) හි සඳහන් කොන්දේසි වලට යටත්ව, අදාළ වන්නේ ය.

(4) **1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් ආරම්භ වන ඉදිරි වර්ෂ හතක (07) කාලය තුළ ගමනාගමනය සඳහා භාවිත කරනු ලබන රථ වාහන හැර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන පරිදි ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ ආනයනය නිෂ්පාදන බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය. මෙම බදු නිදහස් කිරීම ව්‍යාපෘති කාර්යය සඳහා ව්‍යාපෘති සමාගමේ කොන්ත්‍රාත්කරුවකුට හෝ උප - කොන්ත්‍රාත්කරුවකුට ද අදාළ විය යුතු ය.

(5) **1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් ආරම්භ වන ඉදිරි වර්ෂ හතක (07) කාලය තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ ආනයනය සෙස් බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය. මෙම බදු නිදහස් කිරීම ව්‍යාපෘති කාර්යය සඳහා ව්‍යාපෘති සමාගමේ කොන්ත්‍රාත්කරුවකුට හෝ උප - කොන්ත්‍රාත්කරුවකුට ද අදාළ විය යුතු ය.

(6) **ජාතිය ගොඩනැගීමේ බදු** (NBT)

පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් ආරම්භ වන ඉදිරි වර්ෂ හතක (07) කාලය තුළ ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම, කොන්ත්‍රාත්කරු හෝ උප - කොන්ත්‍රාත්කරු නිදහස් කරනු ලැබිය යුතු ය.

එතකුදු වුවත්, හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ආයෝජක වශයෙන් ඇතුළත් වීමේදී ව්‍යාපෘති සමාගමේ කොටස් ගණුදෙනුව හෝ වත්කම් පැවරුම සම්බන්ධයෙන් ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(7) **ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ ආනයන මත රේගු බදු (235 වන අධිකාරය වූ රේගු ආඥා පනත)**

පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් ආරම්භ වන ඉදිරි වර්ෂ හතක (07) කාලය තුළ ගමනාගමනය සඳහා භාවිත කරනු ලබන රථ වාහන හැර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන පරිදි ව්‍යාපෘති කාර්යය සඳහා ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ ආනයන සියල්ල රේගු බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය. මෙම රේගු බදු ගෙවීමෙන් නිදහස් කිරීම පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් අනතුරුව ආරම්භ වන ඉදිරි වර්ෂ හතක (07) කාලය තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන පරිදි ව්‍යාපෘති සමාගම විසින් සෘජුවම කරනු ලබන ආනයන හෝ කොන්ත්‍රාත්කරුවකු හෝ උප - කොන්ත්‍රාත්කරුවකු මඟින් සපයා ගනු ලබන භාණ්ඩ සියල්ලටම අදාළ විය යුතු ය. නිෂේධක ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ සියල්ල ද රේගු බද්දෙන් නිදහස් විය යුතු ය. එතකුදු වුවත්, එවැනි භාණ්ඩ ශ්‍රී ලංකාව තුළ සම්පූර්ණයෙන් නිෂ්පාදනය නොවිය යුතු හෝ ව්‍යාපෘතිය නිම කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රමාණයන්ගෙන්, තත්ත්වයෙන් හා කාල වකවානු ඇතුළත ලබාගත නොහැකි විය යුතු ය.

මලික් සමරවික්‍රම, පා.ම.
සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2017 නොවැම්බර් මස 04 වන දින දී ය.

11 - 977/1

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 (2) වගන්තිය යටතේ වන දැන්වීම

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ (ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත) 3 (2) වගන්තිය යටතේ සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ විෂය භාර අමාත්‍ය, මලික් සමරවික්‍රම වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසමින්, මෙම නිවේදනය මගින් -

(1) හම්බන්තොට වරාය (වරාය) සංවර්ධන ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කිරීම සහ වාණිජමය වශයෙන් ලාභදායී ජාතික වත්කමක් බවට එම ව්‍යාපෘතිය පත් කිරීම (ව්‍යාපෘතිය) පිණිස ඉහත කී පනතේ කාර්යය සඳහා එකී ව්‍යාපෘතිය ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගනු ලැබේ. මෙම ව්‍යාපෘතිය මගින් සුවිශේෂී ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ රටට අත්වනු ඇත;

- මෙම ව්‍යාපෘතිය ජාතික වැදගත් කමකින් යුතු අතර රටේ සුභ සිද්ධිය පිණිස වූවකි : ස්කන්ධ ප්‍රාග්ධනය, ජාත්‍යන්තර වෘත්තීය කළමනාකාරිත්ව ප්‍රමිති ඒ සඳහා යෙදවීම මෙන්ම, ව්‍යාපෘතිය මගින් ජාතික ආර්ථිකය මත පටවා ඇති අධිකතර බර හා සෘණාත්මක බලපෑම් මඟහරවා ගනිමින් ජවසම්පන්න ව්‍යාපාරික ආකෘතියක් උපයෝගී කර ගැනීම තුළින් දැනට පාඩු ලබන තත්ත්වයේ පවතින මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ලාභදායී ව්‍යාපාරයක් බවට පත් කෙරෙනු ඇත;
- රට තුළ ක්‍රියාත්මක එක් සුවිශාලතම සෘජු විදේශ ආයෝජන ව්‍යාපෘතියක් වන මෙම ව්‍යාපෘතිය තුළින් විදේශ විනිමය ඉතා විශාල ප්‍රමාණයන්ගෙන් රට තුළට ගලා එන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන කාලය ඇතුළත එක්සත් ජනපද ඩොලර් මිලියන හාරසියයේ සිට හයසියය (එ. ජ. ඩොලර් මිලියන 400-600) අතර ප්‍රමාණයක අතිරේක ආයෝජන රට තුළට ගෙන්වා ගැනීමේ හැකියාව ද පවතී;
- තරඟකාරීව හා කාර්යක්ෂමව මෙහෙයුම් කටයුතු සිදු කෙරෙන වාණිජ වරායක දැඩි අවශ්‍යතාවක් පවතින අතර වරාය ආශ්‍රිත මෙන්ම ආනයන අභිමුඛ ආයෝජන ආකර්ශනය කර ගැනීම සඳහා එවැනි වරායක් මහත් උත්ප්‍රේරකයක් ද වනු ඇත. ප්‍රතිව්‍යුහගත කරනු ලබන මෙම වරාය, සෘජු විදේශ ආයෝජන වැඩි වැඩියෙන් රට තුළට ගලා ඒම මෙන්ම අපනයන ඉහළ යාම සඳහා ඉඩ ප්‍රස්ථා සලසා දෙමින් එකී අවශ්‍යතාව සපුරා ලනු ඇත.
- මෙම ව්‍යාපෘතිය මගින් දකුණු පළාතට සුවිශාල ප්‍රතිලාභ අත් කර දෙමින් යටිතල පහසුකම් සංවර්ධනයටත්, භව්‍ය රැකියා උත්පාදනයටත්, ඒ තුළින් එම පළාතේ වෙසෙන ජනතාවට ආදායම් උපයා ගැනීමේ අවස්ථා වර්ධනය කිරීමටත් මංපෙත් විවර කරයි.
- මෙම ව්‍යාපෘතිය තුළින් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර සමුද්‍රීය මධ්‍යස්ථානයක තත්ත්වයට උත්ශ්‍රේණිගත වනු ඇත.

(2) මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති සමාගම වන්නේ සීමාසහිත හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම යි (ව්‍යාපෘති සමාගම). ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා එහි වාණිජ මෙහෙයුම් ආරම්භ කෙරෙන දිනය ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(5) වගන්තිය ප්‍රකාර පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් ආරම්භ වන වර්ෂ හතක (07) කාලය (ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන කාලය) තුළ විය යුතු ය.

(3) එක්සත් ජනපද ඩොලර් මිලියන හයසිය හයක (එ.ජ. ඩොලර් මිලියන 606) ආයෝජනයක් යොදවමින් වරාය ආරක්ෂාව, ජලතරණ සේවා, නියමුව, නැංගුරම්ලෑම, ජලතරණය සඳහා සහායක සේවා සැලසීම, මඩ කැණීම, හදිසි ප්‍රතිචාර (ප්‍රධාන හා නඩත්තු) පුළුල් කිරීම හා දූෂණ පාලන සේවා ආදිය ඇතුළත් එහෙත් ඒවාට පමණක් සීමා නොවන හම්බන්තොට වරායේ පොදු පරිශීලක පහසුකම් සහ සේවාවන් කළමනාකරණය (ව්‍යාපෘති ක්‍රියාකාරකම්) ව්‍යාපෘති සමාගම විසින් භාර ගනු ලැබේ.

(4) සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ප්‍රකාර, ඉහත ව්‍යාපෘතියේ කාර්යය සඳහා මෙම දැන්වීමේ 1 වන උපලේඛනයේ සඳහන් නිදහස් කිරීම් මෙම ව්‍යාපෘති සමාගමට අදාළ වන බව නිශ්චිතව දක්වනු ලැබේ.

**උපලේඛනය 1**

**(1) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

(i) *ආයතන ආදායම් බදු*

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් මගින් උපයා ගනු ලබන ලාභ, ඉපැයීම් හා ආදායම් මත පනවනු ලබන ආදායම් බදු සම්බන්ධයෙන් වන 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන වර්ෂ විසි පහක (25) කාලයක් (බදු නිදහස් කාල සීමාව) සඳහා ව්‍යාපෘති සමාගමට අදාළ නොවිය යුතු ය.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුව, චයිනා මර්චන්ට්ස් පෝර්ට් හෝල්ඩිංග්ස් කොම්පැනි ලිමිඩට්, හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝර්ට් සර්විසර්ස් කොම්පැනි (ප්‍රයිවෙට්) ලිමිඩට් සහ ව්‍යාපෘති සමාගම අතර එළැඹුණු 2017 ජූලි මස 29 දින දරන අනුග්‍රහ ගිවිසුම (අනුග්‍රහ ගිවිසුම) බලාත්මක වන දින සිට වර්ෂ හතක (07) කාලයකින් එකී බදු නිදහස් කාල පරිච්ඡේදය ආරම්භ විය යුතු ය.

කෙසේ වුවද, එකී බදු නිදහස් කාල පරිච්ඡේදය අවසන් වූ පසු, තත්කාලයේ බලාත්මක දේශීය ආදායම් පනතේ විධි විධාන ප්‍රකාර ව්‍යාපෘති සමාගමේ ලාභ, ඉපැයීම් හා ආදායම් වලට අදාළ ආදායම් බදු ගෙවනු ලැබිය යුතු ය.

එතකුදු වුවත්, හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ආයෝජක වශයෙන් ඇතුළත් වීමේ දී ව්‍යාපෘති සමාගමේ කොටස් ගනුදෙනුව හෝ වත්කම් පැවරුම සම්බන්ධයෙන් සමායතන ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

කෙසේ වුවද, එකී බදු නිදහස් කාල පරිච්ඡේදය ඇතුළත ව්‍යාපෘතියේ දළ මෙහෙයුම් ආදායමෙන් 0.05% අනුපාතිකයක් මත ආර්ථික සේවා ගාස්තුව අදාළ වනු ඇත.

(ii) *ලාභාංශ මත බදු*

බදු නිදහස් ලාභයෙන්, ඉපැයීම් වලින් කොටස්කරුවන්ට ගෙවනු ලබන ලාභාංශ අනුග්‍රහ ගිවිසුම බලාත්මක වන දිනයේ සිට වර්ෂ විසි පහක (25) බදු නිදහස් කාල පරිච්ඡේදය තුළ හා එය ඉකුත් වීමෙන් පසු එක් වර්ෂයක (01) කාලයක් තුළ ආදායම් බද්දෙන් නිදහස් කළ යුතු ය.

(iii) *රඳවුම් බදු*

පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් ආරම්භ වන ඉදිරි වර්ෂ හතක (07) කාලය තුළ පහත සඳහන් ගාස්තු මත රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් කළ යුතු ය :

(අ) කළමනාකරණ ගාස්තු හා රාජ්‍ය භාගය, එතකුදු වුවත් එවැනි ගාස්තු සමස්ත එකතුව දළ මෙහෙයුම් ආදායමෙන් සියයට තුනක් (3%) නොඉක්ම විය යුතු ය.

(ආ) අලෙවිකරණ ගාස්තු, එතකුදු වුවත් එවැනි ගාස්තු සමස්ත එකතුව දළ මෙහෙයුම් ආදායමෙන් සියයට එකයි දශම පහක් (1.5%) නොඉක්ම විය යුතු ය.

(ඇ) ප්‍රසාද දීමනා කළමනාකරණ ගාස්තු, එතකුදු වුවත් එවැනි ගාස්තු සමස්ත එකතුව දළ මෙහෙයුම් ලාභයෙන් සියයට තුනක් (3%) නොඉක්ම විය යුතු ය.

කෙසේ වුවද, පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් ආරම්භ වන ඉදිරි වර්ෂ විසිපහක (25) කාලය තුළ ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ලබාගත් විදේශ ණයවල පොලිය මත සහ උපදේශකයන් සඳහා ගෙවනු ලබන තාක්ෂණික ගාස්තු හෝ සේවා ගාස්තු මත රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් කරනු ලැබිය යුතු ය.

(iv) *උපයන විට ගෙවීමේ බදු*

පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් ආරම්භ වන ඉදිරි වර්ෂ හතක (07) කාලය තුළ ව්‍යාපෘති සමාගමේ විදේශීය රැකියා නියුක්තිකයන් උපයන විට ගෙවීම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු අතර සෑම අවස්ථාවක දී ම එම සේවා නියුක්තිකයන් තුනක (03) උපරිමයකට යටත් විය යුතු ය.

(2) **2002 අංක 14 දරන එකතු කළ අගය මත (වැට්) බදු පනත**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන පරිදි ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ ආනයන හා දේශීය මිලදී ගැනීම් හෝ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවාවන් සඳහා පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් ආරම්භ වන ඉදිරි වර්ෂ හතක (07) කාලය තුළ එකතු කළ අගය මත බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය. දේශීය මිලදී ගැනීම් හා ආනයනවලට අදාළ බදු නිදහස් කිරීම ව්‍යාපෘතියේ කාර්යය සඳහා ව්‍යාපෘති සමාගමේ කොන්ත්‍රාත්කරුට හෝ උප - කොන්ත්‍රාත්කරුට ද අදාළ විය යුතු ය.

එතකුදු වුවත්, හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ආයෝජක වශයෙන් ඇතුළත් වීමේ දී ව්‍යාපෘති සමාගමේ කොටස් ගණුදෙනුව හෝ වත්කම් පැවරුම සම්බන්ධයෙන් එකතු කළ අගය මත බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(3) **2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත (PAL)**

පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් අනතුරුව ආරම්භ වන ඉදිරි වර්ෂ හතක (07) කාලය තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන පරිදි ආනයන කරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ සඳහා වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් කරනු ලැබිය යුතු ය. ව්‍යාපෘති සමාගම විසින් ව්‍යාපෘතිය සඳහා කරනු ලබන ඍජු ආනයන හෝ ව්‍යාපෘති කාර්යය සඳහා කොන්ත්‍රාත්කරුවකු හෝ උප - කොන්ත්‍රාත්කරුවකු විසින් කරනු ලබන ආනයන සඳහා මෙහි පහත අයිතම අංක (07) හි සඳහන් කොන්දේසි වලට යටත්ව, මෙම බදු නිදහස් කිරීම අදාළ වන්නේ ය.

(4) **1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන පරිදි ගමනාගමනය සඳහා භාවිත කරනු ලබන රථ වාහන හැර ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ ආනයනය පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් ආරම්භ වන ඉදිරි වර්ෂ හතක (07) කාලය තුළ නිෂ්පාදන බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය. මෙම බදු නිදහස් කිරීම ව්‍යාපෘති කාර්යය සඳහා ව්‍යාපෘති සමාගමේ කොන්ත්‍රාත්කරුවකුට හෝ උප - කොන්ත්‍රාත්කරුවකුට ද අදාළ විය යුතු ය.

(5) **1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් ආරම්භ වන ඉදිරි වර්ෂ හතක (07) කාලය තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ ආනයනය සෙස් බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය. මෙම බදු නිදහස් කිරීම ව්‍යාපෘති කාර්යය සඳහා ව්‍යාපෘති සමාගමේ කොන්ත්‍රාත්කරුවකුට හෝ උප- කොන්ත්‍රාත්කරුවකුට ද අදාළ විය යුතු ය.

(6) **ජාතිය ගොඩනැගීමේ බදු (NBT)**

පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් ආරම්භ වන ඉදිරි වර්ෂ හතක (07) කාලය තුළ ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම, කොන්ත්‍රාත්කරු හෝ උප - කොන්ත්‍රාත්කරු නිදහස් කරනු ලැබිය යුතු ය.

එතකුදු වුවත්, හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ආයෝජක වශයෙන් ඇතුළත් වීමේ දී ව්‍යාපෘති සමාගමේ කොටස් ගනුදෙනුව හෝ වත්කම් පැවරුම සම්බන්ධයෙන් ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(7) **ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ ආනයන මත රේගු බදු (235 වන අධිකාරය වූ රේගු ආඥාපනත)**

පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් ආරම්භ වන ඉදිරි වර්ෂ හතක (07) කාලය තුළ ගමනාගමනය සඳහා භාවිත කරනු ලබන රථ වාහන හැර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන පරිදි ව්‍යාපෘති කාර්යය සඳහා ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ ආනයන සියල්ල රේගු බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය. මෙම රේගු බදු ගෙවීමෙන් නිදහස් කිරීම පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත වීමෙන් අනතුරුව ආරම්භ වන ඉදිරි වර්ෂ හතක (07) කාලය තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන පරිදි ව්‍යාපෘති සමාගම විසින් සෘජුවම කරනු ලබන ආනයන හෝ කොන්ත්‍රාත්කරුවකු හෝ උප - කොන්ත්‍රාත්කරුවකු මඟින් සපයා ගනු ලබන භාණ්ඩ සියල්ලටම අදාළ විය යුතු ය. නිෂේධක ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ සියල්ල ද රේගු බද්දෙන් නිදහස් විය යුතු ය. එතකුදු වුවත්, එවැනි භාණ්ඩ ශ්‍රී ලංකාව තුළ සම්පූර්ණයෙන් නිෂ්පාදනය නොවිය යුතු හෝ ව්‍යාපෘතිය නිම කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රමාණයන්ගෙන්, තත්ත්වයෙන් හා කාල වකවානු ඇතුළත ලබාගත නොහැකි විය යුතු ය.

මලික් සමරවික්‍රම, පා.ම.
සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2017 නොවැම්බර් මස 04 වන දින දී ය.

11 - 977/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.